# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
# විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2020/2021 අධ්‍යයන වර්ෂය
# www.ugc.ac.lk

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම පිණිස, **2020 ඔක්තොම්බර් මස පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගයේද** විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අයදුම්පත් කැඳවනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් වෙත ඒ බව දැනටමත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් දැනුම් දී ඇත.

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා <u>අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමු කිරීම අනිවාර්ය අවශ්‍යතාවක්</u> බව අයදුම්කරුවන්ට දන්වා සිටිනු ලැබේ.

<u>විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම්:</u>

විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිවේදනය කර ඇති, පහත සඳහන් සුදුසුකම් සපුරාලූ අපේක්ෂකයන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

(අ) අවස්ථා තුනකට නොවැඩි වාර ගණනක් තුළ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී එක් වරකදී අනුමත විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබීම.

(ආ) සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයෙන් 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම.

සටහන 1: **සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට අපොහොසත් වූ අපේක්ෂකයන්, ඉසෙඩ් අගය අනුව ඔවුන් යම්කිසි විශ්වවිද්‍යාලයක පාඨමාලාවකට මෙම අධ්‍යයන වර්ෂයේදී තේරී පත් වුවහොත් එම තේරී පත් වූ පාඨමාලාවේ ලියාපදිංචිවීම සඳහා සුදුසුකම් නොලබයි.**

**එවැනි අපේක්ෂකයෙකු සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක්, විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබීම සඳහා වූ අනුමත අවස්ථා තුනට යටත්ව පෙර අවස්ථාවකදී සපුරා ඇත්නම්, එම අපේක්ෂකයා දැනට තේරී සිටින පාඨමාලාව අදාළ විශ්වවිද්‍යාලයේ හැදෑරීම සඳහා ලියාපදිංචිවීමට සුදුසුකම් ලබයි.**

**සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට අපොහොසත් වූ අපේක්ෂකයන්, විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබීම සඳහා වූ අනුමත අවස්ථා තුනට යටත්ව ඉදිරි වර්ෂයකදී ඒ සඳහා පෙනී සිට එය සමත් වුවහොත්, ඉසෙඩ් අගය අනුව දැනට තේරී සිටින පාඨමාලාව ඉදිරි අධ්‍යයන වර්ෂයකදී අදාළ විශ්වවිද්‍යාලයේ හැදෑරීම සඳහා ලියාපදිංචිවීමට සුදුසුකම් ලබයි.**

<u>2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළ ප්‍රවේශ අත්පොත ලබා ගන්නා ආකාරය :</u>

2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත පහත දක්වා ඇති ඕනෑම ආකාරයකින් **2021.05.21 දින සිට**, එක් පොතක් සඳහා රු. 500/= ක මුදලක් ගෙවා ලබා ගත හැකිය.

(අ) අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ස්ථානයේ පිහිටි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන්.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රවේශ අත්පොත් අලෙවි කිරීම සඳහා පත්කර ඇති බෙදාහැරීමේ නියෝජිතයන් වෙතින්. (එම නියෝජිතයන්ගේ ලැයිස්තුව පහතින් දක්වා ඇත).

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අන්තර්ජාලය මගින් රු.500/= ක මුදලක් ගෙවා, විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි මෘදු පිටපතක්, නිල වෙබ් අඩවිය වන www.ugc.ac.lk මගින් බාගත කරගත හැක.

(ඈ) පහත සඳහන් විශ්වවිද්‍යාලවල සුභසාධක අංශ මඟින් :

i. කොළඹ විශ්වවිද්‍යාලය

ii. පේරාදෙණිය විශ්වවිද්‍යාලය

iii. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

iv. කැලණිය විශ්වවිද්‍යාලය

v. මොරටුව විශ්වවිද්‍යාලය

vi. යාපනය විශ්වවිද්‍යාලය

vii. රුහුණ විශ්වවිද්‍යාලය

viii. නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ix. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

x. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

xi. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

xii. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

xiii. ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

xiv. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

xv. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

(ඉ) තැපැල් මගින්ද විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත් ලබා ගත හැකිය.

ඒ සඳහා ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස් කිරීමේ ගිණුම් අංක 0002323287 ට හෝ මහජන බැංකුවේ පුරහල ශාඛාවේ රැස් කිරීමේ ගිණුම් අංක 167-1-001-4-3169407ට බැර වන සේ, ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට එක් ප්‍රවේශ අත්පොතක් වෙනුවෙන් රු. 500/= ක් බැගින් ගෙවා ලබා ගත් කුවිතාන්සියක්, ප්‍රවේශ අත්පොත ලබාගැනීම සඳහා කරන ලිඛිත ඉල්ලීම සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවිය යුතුය. තවද, නියමිත මුදල් ගෙවූ බවට බැංකු ශාඛාවේ මුද්‍රාව තබා බලයලත් නිලධාරියකු විසින් එම බැංකු කුවිතාන්සිය අත්සන් කර තිබිය යුතුය.

එසේ බැංකු කුවිතාන්සියක් එවා ප්‍රවේශ අත්පොත් තැපැල් මගින් ලබා ගැනීමේදී, අයදුම්කරුගේ නම හා අවශ්‍ය ප්‍රවේශ අත්පොතේ මාධ්‍යය සඳහන් කර තමාගේ ලිපිනය ලියන ලද මුද්දර නොගැසූ 37 cm x 26 cm ප්‍රමාණයේ ලියුම් කවරයක් සමඟ ලිඛිත ඉල්ලීමක් අයදුම්කරුවන් විසින් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විශ්වවිද්‍යාල ප්‍රවේශ), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

**"ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2020/2021"** නැමැති විශ්වවිද්‍යාල ප්‍රවේශය පිළිබඳ අත්පොත සමඟ විශාල ප්‍රමාණයේ (37 cm x 26 cm) ලියුම් කවරයක් අයදුම්කරුවන් වෙත නිකුත් කෙරේ. අන්තර්ජාලය හරහා අයදුම්කර ඉන් ලැබෙන මුද්‍රිත පිටපත නිසි පරිදි පුරවා අත්සන් කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවීමට අයදුම්කරුවන් මෙම ලියුම් කවරය භාවිත කළ යුතුය. එබැවින්, මෙම ලියුම් කවරය විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත මිලදී ගැනීමේදී තමන්ට ලැබී ඇති බවට අයදුම්කරුවන් වග බලා ගත යුතුය.

<u>අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත් යොමු කිරීම</u>

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.ugc.ac.lk ට පිවිස අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් යොමු කිරීම අනිවාර්යය අවශ්‍යතාවක් වේ.**

**සටහන 2:** **ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේ පිළිවෙළ උදෙසා 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 4 වන කොටස කියවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.**

**සටහන 3:** **අන්තර්ජාල සේවාව හරහා අයදුම්පත් යොමු කිරීමට අවශ්‍ය උපදෙස් 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළ ප්‍රවේශ අත්පොතෙහි 5 වන කොටසෙහි දක්වා ඇත.**

**සටහන 4:** **විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කිරීමට අන්තර්ජාල පහසුකම් නොමැති අයදුම්කරුවන්ට දිවයින පුරා පිහිටි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානවලදී (NAC Centres), අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පළාත් සහ කලාපීය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානවලද (ICT Centres) සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) යටතේ ඇති නැණසල මධ්‍යස්ථානවලදී ඒවා විවෘත කර තබන වේලාවන්හිදී අන්තර්ජාලය හරහා තම විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත යොමු කිරීමට අවශ්‍ය පහසුකම් නොමිලේ සළසා දී ඇත. මෙම මධ්‍යස්ථානවල ලිපිනයන් සහ දුරකථන**

අංකයන් 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා වූ ප්‍රවේශ අත්පොතේ 5 වන කොටස අවසානයෙහි දක්වා ඇත.

සටහන 5: අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටින අවස්ථාවේ සිය අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතක් භාවිත නොකළ අයදුම්කරුවන්ට අන්තර්ජාල සේවාව භාවිත කරමින් අයදුම්පත් යොමු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළ ප්‍රවේශ අත්පොතේ 5 වන කොටසේ පිටු අංක 146-147 දක්වා ඇත.

සටහන 6: අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත පිරවීමේදී යම් ගැටලුවක් ඇති වුවහොත් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (1919) අමතා උපදෙස් ලබාගත හැකිය.

<u>අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය :</u>

<u>අයදුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනය 2021.06.11 වැනි දින වේ</u>. 2021.06.11 දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර නොගන්නා බව අයදුම්කරුවන්ට මෙයින් දන්වා සිටිනු ලැබේ.

අන්තර්ජාලය මඟින් අයදුම්පත යොමු කිරීමෙන් පසුව ලැබෙන මුද්‍රිත අයදුම්පත විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි දැක්වෙන උපදෙස් පරිදි අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව **ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විශ්වවිද්‍යාල ප්‍රවේශ), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඒ සඳහා අත්පොත මිළදී ගැනීමේදී ලබාදුන් ලියුම් කවරය පමණක් භාවිත කළ යුතුය.

වැදගත් :

**දැනට රට තුළ පවතින කොරෝනා අධි වසංගත තත්වය හේතුවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අන්තර්ජාලය මඟින් අයදුම්පත යොමු කිරීමෙන් පසුව ලබා ගන්නා මුද්‍රිත අයදුම්පත විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි දැක්වෙන උපදෙස් පරිදි අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, එය ලියාපදිංචි තැපැල මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කිරීමට අමතරව, සම්පූර්ණ අයදුම්පතෙහි ස්කෑන් පිටපතක් හෝ පැහැදිලි ඡායාරූපයක් "apply2020@ugc.ac.lk" යන විද්‍යුත් තැපැල වෙත යොමු කිරීම අනිවාර්යය අවශ්‍යතාවයක් බව කරුණාවෙන් සලකන්න.**

මුද්‍රිත අන්තර්ජාල අයදුම්පත භාරදීම ලියාපදිංචි තැපැලෙන් පමණක් විය යුතු අතර අයදුම්කරුවන්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පැමිණ අයදුම්පත් භාරදිය නොහැකය.

<u>විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලැබීම</u>

2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 1.7 ඡේදයට අනුව පහත සඳහන් කාණ්ඩවලට අයත් සිසුන් අභ්‍යන්තර ශිෂ්‍යයන් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රජයේ විශ්වවිද්‍යාලයකට හෝ උසස් අධ්‍යාපන ආයතනයකට ප්‍රවේශය ලැබීම සඳහා සුදුසුකම් නොලබයි.

1. අ.පො.ස. (උසස් පෙළ) විභාගයට තුන් වතාවකට වැඩි වාර ගණනක් පෙනී සිටි සිසුන්.

2. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීම සඳහා අභ්‍යන්තර සිසුන් වශයෙන් ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්. [මෙම ඡේදය යටතට අදාළ වන රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 1.6 (8) ඡේදයෙහි සහ 1.6 (10) ඡේදයෙහි දක්වා ඇත].

3. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ නොවන වෙනත් පාර්ලිමේන්තු පනතක් යටතේ ස්ථාපිත කරන ලද විශ්වවිද්‍යාලයක / ආයතනයක ප්‍රථම උපාධි පාඨමාලා හැදෑරීම සඳහා නිදහස් අධ්‍යාපන අවස්ථාවක් යටතේ අභ්‍යන්තර සිසුන් ලෙස ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්. ඒවා නම් ;

    i. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

    ii. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

    iii. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (නම්ගත කර ඇති කැඩෙට් නිලධාරීන් ලෙස – As Enlisted Officer Cadets)

    iv. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

    v. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (2017 වසරේ සහ ඊට පසු වසරවලදී ලියාපදිංචි වූ සිසුන්)

4. අධ්‍යාපන විද්‍යා පීඨයක (College of Education) අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීම සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්.

5. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය යටතේ ස්ථාපිත කරන ලද විශ්වවිද්‍යාල විද්‍යායතනයක් (University College) මගින් පවත්වනු ලබන තුන් (03) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා නිදහස් අධ්‍යාපන අවස්ථාවක් යටතේ අභ්‍යන්තර සිසුන් ලෙස ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්.

6. පහත **"වැදගත්"** යටතේ සඳහන් කර ඇති ජේදයන්හි දක්වා ඇති විධිවිධානවලට යටත්ව පහත සඳහන් ආයතනයන්හි තුන් (03) අවුරුදු හෝ ඊට වැඩි කාලයක් සහිත පහත දක්වා ඇති පාඨමාලාවක් පූර්ණකාලීනව හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්.

(අ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවත්නා ආයතනයක් මගින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාව.

(ආ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යටතේ ඇති ඉංජිනේරු තාක්ෂණ ආයතනය (IET) මගින් පවත්වන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා (NDES) පාඨමාලාව.

වැදගත්:

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවත්නා ආයතනයක් මගින් පවත්වනු ලබන තුන් (03) අවුරුදු හෝ ඊට වැඩි කාලයක උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක් පූර්ණකාලීනව හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටින සිසුන් සහ / හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යටතේ ඇති ඉංජිනේරු තාක්ෂණ ආයතනය (IET) මගින් පවත්වන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා (NDES) පාඨමාලාව පූර්ණකාලීනව හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටින සිසුන්, ලියාපදිංචිවීම සඳහා අදාළ ආයතනය විසින් ලබා දී ඇති අවසාන දින සිට දින 60 ක කාලයක් ඇතුළත එම ලියාපදිංචිය අවලංගු කර ගතහොත් පමණක්, එසේ ලියාපදිංචි වීමට පදනම් වූ ප්‍රතිඵල ලබා ගත් අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පසුව පැවැත්වූ අ.පො.ස. (උසස් පෙළ) විභාගයක ප්‍රතිඵල මත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ පිහිටුවා ඇති විශ්වවිද්‍යාලයක / උසස් අධ්‍යාපන ආයතනයක යම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා ප්‍රවේශය ලැබීමට අයදුම් කිරීමට සුදුසුකම් ලැබිය හැකිය.

ලියාපදිංචිවීම සඳහා අදාළ ආයතනය විසින් ලබා දී ඇති අවසාන දින සිට දින 60 ක කාලයක් ඇතුළත ඉහත 6 ජේදයෙහි සඳහන් කරන ලද පාඨමාලාවක ලියාපදිංචිය අවලංගු කර නොගත් කිසියම් අපේක්ෂකයෙකු ඉහත 6 ජේදයට අයත් වන බැවින් එසෙ ලියාපදිංචිවීමට පදනම් වූ ප්‍රතිඵල ලබා ගත් අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පසුව පැවැත්වූ අ.පො.ස. (උසස් පෙළ) විභාගයක ප්‍රතිඵල මත, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රථම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබීමට සුදුසුකම් නොලබයි.

ඉහත දක්වන ලද දින 60 ක් ඇතුළත ලියාපදිංචිය අවලංගු කරගෙන නැවත විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළ හැකි වීමේ සහනය, ඉහත 6 ජේදයෙහි සඳහන්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවත්නා ආයතනයක් මගින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යටතේ ඇති ඉංජිනේරු තාක්ෂණ ආයතනය (IET) මගින් පවත්වන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා (NDES) පාඨමාලාවක **පුරප්පාඩුවක් පිරවීමට** තෝරාගත් සිසුවෙකුට හිමි නොවේ.

සටහන 7: **ලියාපදිංචිවීම සඳහා ඉහත 6 ජේදයේ සඳහන් කරන ලද ආයතනයක් විසින් ලබා දී ඇති අවසාන දින සිට දින 60 ක කාලයක් ඇතුළත අදාළ ආයතනය මගින් පවත්වනු ලබන පාඨමාලාවක ලියාපදිංචිය අවලංගු කර ගත් අයදුම්කරුවකු එම ආයතනයෙන් නිකුත් කරන ලද ලියාපදිංචිය අවලංගු කර ගැනීමේ ලිපියේ පිටපතක් අයදුම්පත සමග එවිය යුතුය.**

7. ප්‍රථම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විදේශ ශිෂ්‍යත්වයක් ලබා ගත් සිසුන්.

8. ඉහත 2, 3, 4, 5, 6 සහ 7 යන ජේද යටතේ සඳහන් උසස් අධ්‍යාපන ආයතනයකින් දැනටමත් ප්‍රථම උපාධියක් හෝ අදාළ සුදුසුකමක් ලබා ඇති සිසුන්.

9. විශ්වවිද්‍යාල ප්‍රවේශය සහ/ හෝ එහි ලියාපදිංචිය සඳහා මෙම අධ්‍යයන වර්ෂයේ හෝ පෙර අධ්‍යයන වර්ෂයකදී අසත්‍ය තොරතුරු ප්‍රකාශ කර ඇති සහ/ හෝ ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කර ඇති සිසුන්.

සටහන 8: **යම් ලෙසකින් විශ්වවිද්‍යාලයකට/ උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් කරගැනීමට පෙර විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේදී හෝ ලියාපදිංචිය සඳහා ශිෂ්‍යයා විසින් සපයන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය බව අනාවරණය වුවහොත් එම අධ්‍යයන වර්ෂයට අදාළ ඔහුගේ/ ඇයගේ විශ්වවිද්‍යාල තේරී පත්වීම සහ විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත අවලංගු කිරීමට කටයුතු කරන අතර ඉන් ඉදිරියට කිසිදු අධ්‍යයන වර්ෂයකදී යළිත් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට එම ශිෂ්‍යයාට අවසර දෙනු නොලැබේ.**

**තවද, යම් ලෙසකින් විශ්වවිද්‍යාලයකට/උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් කරගැනීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේදී හෝ ලියාපදිංචිය සඳහා ශිෂ්‍යයා විසින් සපයන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය බව අනාවරණය වුවහොත් එම ශිෂ්‍යයා අදාළ විශ්වවිද්‍යාලයෙන්/උසස් අධ්‍යාපන ආයතනයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.**

<u>අනෙකුත් වැදගත් තොරතුරු</u>

(අ) <u>අයදුම්පතෙහි පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා කැමැත්තේ අනුපිළිවෙල සඳහන් කිරීම</u>

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල 15 ක්, මණ්ඩප 03 ක් සහ උසස් අධ්‍යාපන ආයතන 04 ක් මගින් විවිධ උපාධි පාඨමාලා 119 ක් පවත්වනු ලබයි.

සෑම විශ්වවිද්‍යාලයක් / මණ්ඩපයක් / උසස් අධ්‍යාපන ආයතනයක් මගින්ම පවත්වනු ලබන එක් එක් අධ්‍යයන පාඨමාලා සඳහා එකිනෙකට අනන්‍ය වූ කේතයන් ලබා දී ඇත. මෙම කේතය **"Uni-Code"** ලෙස හැඳින්වේ. සියලු කේත (Uni-Code) සංඛ්‍යාව 244 ක. කේත සියල්ල අඩංගු ලැයිස්තුව 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතේ **පිටු අංක 161-166** හි දක්වා ඇත.

සෑම අපේක්ෂකයෙකුටම තමන් ඇතුළත්වීමට සුදුසුකම් ලබන "Uni-Codes" (එනම් පාඨමාලා සහ විශ්වවිද්‍යාල) කැමති සංඛ්‍යාවක් සඳහා ඉල්ලුම් කළ හැකිය. නමුත් කිසිදු ශිෂ්‍යයෙකු කේත (Uni-Codes) 244 සඳහාම අයදුම් කිරීමට කිසිඳු ලෙසකින් සුදුසුකම් නොලබයි. තමන් සුදුසුකම් ලබන පාඨමාලා මොනවාද යන්න අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පෙනී සිටි විෂයයන් අනුව තීරණය වේ. කෙසේ වෙතත්, ප්‍රවේශය සඳහා අයදුම්කිරීමේදී සිසුන්ට උපරිම වශයෙන් තේරීම් 125 ක් ලකුණු කිරීම සඳහා අවස්ථාව ලබාදී ඇත.

ඒ සඳහා තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කළ යුත්තේ පිළිවෙළින් වැඩි කැමැත්තක් ඇති කේතයේ (Uni-Code) සිට අඩු කැමැත්තක් ඇති කේතය (Uni-Code) දක්වා වේ. මෙහිදී අපේක්ෂකයාගේ කැමැත්ත අඩුවන ආකාරයට කේතයන් (Uni-Codes) පෙළ ගැස්විය යුතුය. කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීමේදී එකම කේතය (Uni-Code) එක් වරකට වඩා ඇතුළත් කිරීමට සිසුනට ඉඩදෙනු නොලැබේ.

**ප්‍රවේශය සඳහා තෝරා ගැනීමේදී, අපේක්ෂකයා කැමැත්ත දක්වා ඇති අධ්‍යයන පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය යන කරුණු දෙකම එකවර සළකා බලනු ලැබේ.**

සෑම විටම තමන් සුදුසුකම් ලබන උපරිම කේත (Uni-Codes) සංඛ්‍යාවක් සිය අයදුම්පතෙහි සඳහන් කිරීමට අයදුම්කරුවන්ට තරයේ උපදෙස් දෙනු ලැබේ. අයදුම්කරුවන් සළකා බලනු ලබන්නේ තමන් විසින් මනාපය දක්වා ඇති අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා පමණි. **අයදුම්කරුවන් විසින් කැමැත්ත ප්‍රකාශ කර නොමැති අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා ඔවුන් සළකා බලනු නොලැබේ.** ඒ අනුව, යම් කිසි ශිෂ්‍යයෙකු යම් විශ්වවිද්‍යාලයක පවත්වන යම් අධ්‍යයන පාඨමාලාවකට (Uni-Code) ඉසෙඩ් අගය අනුව සුදුසුකම් ලැබුවත් එම කේතය (Uni-Codes) සඳහා ඔහු / ඇය විසින් මනාපයක් සඳහන් කර නොමැති නම් ඒ සඳහා ඔහු / ඇය අනුයුක්ත නොකරන අතර ඒ වෙනුවට ඔහු / ඇය විසින් ඊළඟට මනාපය දක්වා ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය ("Uni-Code") සඳහා ඔහු / ඇය සළකා බලනු ලැබේ.

සටහන 9: **"Uni-Codes" භාවිත කර කැමැත්තේ අනුපිළිවෙල සඳහන් කිරීමට අවශ්‍ය උපදෙස් සඳහා 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළ ප්‍රවේශ අත්පොතෙහි 3 වන කොටස කියවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.**

සටහන 10: **කිසියම් ශිෂ්‍යයෙකු කිසියම් විශ්වවිද්‍යාලයක් මගින් පවත්වනු ලබන යම් පාඨමාලාවක් (Uni-Code) සඳහා තේරී පත්වී ඒ සඳහා ලියාපදිංචි නොවුනහොත්, පුරප්පාඩු පිරවීමේ වටයන්හිදී ඔහු/ ඇය එම පාඨමාලාව පවත්වන වෙනත් විශ්වවිද්‍යාල සඳහා සිය විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි ඉහළ මනාපයන් දක්වා තිබුණද ඒ කිසිඳු විශ්වවිද්‍යාලයක් සඳහා එම පාඨමාලාව හැදෑරීම පිණිස ඔහුගේ/ ඇයගේ අයදුම්පත යළි සළකා බලනු නොලැබේ. ඒ වෙනුවට, ඔහු/ ඇය ඊළඟට ඉහළ මනාපය සඳහන් කර ඇති අනෙක් පාඨමාලාව සඳහා ඔහුගේ/ ඇයගේ අයදුම්පත සළකා බලනු ලැබේ.**

**මේ පිළිබඳව වැඩිදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි පිටු අංක 135-136 හි "වැදගත්" යනුවෙන් සඳහන් කර ඇති නිදර්ශනය කියවා බලන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.**

(ආ) <u>ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවය</u>

පහත දැක්වෙන අධ්‍යයන පාඨමාලාවන් සඳහා ඇතුළත්වීමට අදහස් කරන අපේක්ෂකයන් අදාළ විශ්වවිද්‍යාල මගින් පවත්වන ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණයකට ද පෙනී සිටීම සඳහා ඉල්ලුම් කර එය සමත් විය යුතුය. **අදාළ විශ්වවිද්‍යාල පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර සිසුන් විසින් තම ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම්පත් කෙලින්ම අදාළ විශ්වවිද්‍යාලය වෙත යොමුකළ යුතුය.** ඒ පිළිබඳ වැඩි විස්තර අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් ලබා ගත හැකය. ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලබන විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල දුරකථන අංක

ප්‍රවේශ අත්පොතේ 313 පිටුවේ දක්වා ඇත. **කෙසේ නමුත්, අදාළ පාඨමාලාව සඳහා සළකා බැලීමට නම් ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණය සමත් වීමට අමතරව අදාළ පාඨමාලාවේ කඩඉම් ලකුණ සම්පූර්ණ කර තිබීමද අනිවාර්ය වේ.**

| අධ්‍යයන පාඨමාලාව | විශ්වවිද්‍යාලය / මණ්ඩපය/ ආයතනය | කේතය **(Uni-Code)** |
|---|---|---|
| කලා (SP) - ජනමාධ්‍ය | කොළඹ විශ්වවිද්‍යාලය ( ශ්‍රීපාලි මණ්ඩපය ) | 020S |
| කලා (SP) - ප්‍රසංග කලා | කොළඹ විශ්වවිද්‍යාලය ( ශ්‍රීපාලි මණ්ඩපය ) | 041S |
| වාස්තු විද්‍යාව | මොරටුව විශ්වවිද්‍යාලය | 023G |
| නිර්මාණවේදය | මොරටුව විශ්වවිද්‍යාලය | 024G |
| කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය | කැලණිය විශ්වවිද්‍යාලය | 027D |
| විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | මොරටුව විශ්වවිද්‍යාලය | 034G |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 038K |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | යාපනය විශ්වවිද්‍යාලය ( වව්නියා මණ්ඩපය) | 038R |
| පරිගණක විද්‍යාව සහ තාක්ෂණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 065U |
| ව්‍යවසායකත්වය සහ කළමනාකරණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 066U |
| සංගීතය | ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය | 068X |
| සංගීතය | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 068Y |
| සංගීතය | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 068Z |
| නැටුම් | ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය | 069X |
| නැටුම් | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 069Y |
| නැටුම් | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 069Z |
| චිත්‍ර සහ නිර්මාණ | ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය | 070X |
| නාට්‍ය සහ රංග කලා | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 071Y |
| නාට්‍ය සහ රංග කලා | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 071Z |
| දෘශ්‍ය සහ තාක්ෂණික කලා | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 072Y |
| කාර්මික තොරතුරු තාක්ෂණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 075U |
| ශාරීරික අධ්‍යාපනය | යාපනය විශ්වවිද්‍යාලය | 081E |
| ශාරීරික අධ්‍යාපනය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 081L |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 082C |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | කැලණිය විශ්වවිද්‍යාලය | 082D |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 082L |
| කථන හා ශ්‍රවණ විද්‍යා | කැලණිය විශ්වවිද්‍යාලය | 083D |
| දෘශ්‍ය කලා | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 085Z |
| ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 090U |
| තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය | මොරටුව විශ්වවිද්‍යාලය | 091G |
| තොරතුරු පද්ධති | කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය | 096T |
| භූමි නිර්මාණවේදය | මොරටුව විශ්වවිද්‍යාලය | 097G |
| පරිවර්තන අධ්‍යයන | කැලණිය විශ්වවිද්‍යාලය | 098D |
| පරිවර්තන අධ්‍යයන | යාපනය විශ්වවිද්‍යාලය | 098E |
| පරිවර්තන අධ්‍යයන | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 098H |
| පරිවර්තන අධ්‍යයන | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 098L |
| සිනමා හා රූපවාහිනී අධ්‍යයන | කැලණිය විශ්වවිද්‍යාලය | 100D |
| මූල්‍ය ඉංජිනේරුකරණය | කැලණිය විශ්වවිද්‍යාලය | 110D |

(ඇ) <u>තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ලියාපදිංචි වීම</u>

විශ්වවිද්‍යාල පතිපාදන කොමිෂන් සභාව විසින් 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා අදාළ කඩඉම් ලකුණු නිකුත් කිරීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් වෙත තමා තේරී පත්වූ පාඨමාලාව සහ එම පාඨමාලාව හැදෑරීමට අනුයුක්ත කොට ඇති විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දැනුම් දෙනු ලැබේ. ප්‍රවේශ අත්පොතෙහි 1.6(5), 1.6(6) සහ 4.1 යන ඡේදයන්ට අනුව, අයදුම්කරුවන් එම තෝරා ගැනීම භාර ගන්නේ නම් බැංකුවට හෝ අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට බැර වන සේ ලියාපදිංචි ගාස්තු ලෙස රු.50/-ක මුදල ගෙවා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලියාපදිංචිවීම සඳහා ලබා දුන් අවසන් දින හෝ එදිනට පෙර තමන් සුදුසුකම් ලැබූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ලියාපදිංචි විය යුතුය.

තවද, බැංකුවට මුදල් ගෙවූයේ නම්, ඒ බව සනාථ කිරීම සඳහා ගෙවීම් වවුචරයේ ස්කෑන් කරන ලද පිටපත අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය (Upload).

අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමෙන් අනතුරුව එසේ ලියාපදිංචිවීමෙන් ලද මුද්‍රිත පිටපත (Online Payment Receipt) නිසි පරිදි අත්සන් කර, බැංකුවට මුදල් ගෙවූයේ නම් මුදල් ගෙවූ බවට ලිඛිත සාක්ෂිද සමග [ගෙවීම් වවුචරය] ලයාපදිංචි තැපැලෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එවිය යුතුය.

සටහන 11: **තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමද 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් බව සළකන්න.**

සටහන 12: **සියලුම ශිෂ්‍යයන් තමා තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ලියාපදිංචිවීමේදී විශ්වවිද්‍යාල භූමියෙන් ඇතුළත හෝ පිටත නවක වදය ඇතුළු සියලු හිංසාකාරී ක්‍රියාවන්ගෙන් වැළකී සිටීමට එකඟවීමේ දිවුරුම් ප්‍රකාශයක් අත්සන් කළ යුතු වේ. එම දිවුරුම් ප්‍රකාශය ශිෂ්‍යයා සහ ඔහුගේ /ඇයගේ දෙමව්පියෙකු විසින් අත්සන් කිරීම අනිවාර්ය වේ. දෙමව්පියන් නොමැති සිසුවෙකු නම්, එම සිසුවාට අමතරව ඔහුගේ / ඇයගේ නීත්‍යානුකූල භාරකරු විසින්ද එය අත්සන් කළ යුතුවේ.**

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත බෙදා හැරීමේ නියෝජිතයින්
## අධ්‍යයන වර්ෂය -2020/2021

01. කොළඹ -
එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, මරදාන පාර, කොළඹ 10.
සදීපා පොත්හල, 1060, මරදාන පාර, බොරැල්ල, කොළඹ 08.
විජිතයාපා පොත්හල,130,එස් ද එස් ජයසිංහ මාවත, කොහුවල, නුගේගොඩ.
විජිතයාපා පොත්හල, යුනිටි ප්ලාසා, 02, ගාලු පාර, කොළඹ 04.
විජිතයාපා පොත්හල, 32, තර්ස්ටන් පාර, කොළඹ 03.
විජිතයාපා පොත්හල, ජී 6 ඒ, ක්‍රෙස්කැට් බෝල්වර්ඩ්, කොළඹ 03.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 30, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 44/ 9, වයි.එම්.බී.ඒ. ගොඩනැගිල්ල, කොටුව.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 70/1/5, වයි.එම්.බී.ඒ. ගොඩනැගිල්ල, බොරැල්ල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 74, හයිලෙවෙල් පාර, මහරගම.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 92 ඒ, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම,592 , මරදාන පාර , කොළඹ 10
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම,4 වන මහල , වන් ගෝල්ෆේස්, සාප්පු සංකීර්ණය, කොළඹ 02.
සසිරි (ප්‍රයිවට්) ලිමිටඩ්, 14, හයිලෙවල් පාර, මහරගම.
පුබාලසිංහම් පොත් වෙළඳ සැල, 340, හෙට්ටි වීදිය, කොළඹ 11.
තුසිත පොත්හල (පුද්ගලික ) සමාගම, 433 Q, ගාලු පාර, රත්මලාන.
සිතුරුවන පොත්හල, නො. 08, ඉංගිරිය පාර, පාදුක්ක.
වික්ටරි පොත්හල, 21, යටියන්තොට පාර, අවිස්සාවේල්ල.
සිතුමිණ පොත්හල, අංක 62, කෙලින් වීදිය, අතුරුගිරිය.

සමුද්‍රා පොත්හල, නො 1141, මරදාන පාර, බොරැල්ල.
සුහසාධක සංගමය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.
සඳලි පොත්හල, 76/4, සේනානායක සංකීර්ණය, හෝමාගම.
ස්ටයිලීස් පොත්හල, 18 / බී, ද මැල් පටුමග, මොරටුව.
ඔනිරෝ පොත් මැදුර, 87, හයිලෙවල් පාර, මහරගම.
ග්‍රන්ථාලෝක මුද්‍රණාලය සහ පොත්හල, 12, හයිලෙවල් පාර, කොට්ටාව, පන්නිපිටිය.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 2, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 02 බී, සමුද්‍රදේවි මාවත, නුගේගොඩ.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 24, හිල් වීදිය, දෙහිවල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 20 ඒ, හිල් වීදිය, දෙහිවල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 70/1/2,වයි. එම්. බී.ඒ. ගොඩනැගිල්ල, කොළඹ 08.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 14, උද්‍යාන පාර, පිළියන්දල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 47, ආර්ථික මධ්‍යස්ථානය, නාරාහේන්පිට.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 147, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, කාන්තා විද්‍යාලය, නො. 66 අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 16, හොරණ පාර, පාදුක්ක.
නව ගයාන් පොත්හල, නො. 14, හයිලෙවල් ප්ලාසා, දෙල්කඳ, නුගේගොඩ.
නව සේනාධීර පොත්හල, නො. 13, හයිලෙවල් පාර, හෝමාගම.
ආසිරි පොත්හල , 10, පාදුක්ක පාර , ගොඩගම , හෝමාගම.
සිතුරුවන පොත්හල (පුද්ගලික) සමාගම, නො 61, මහ වීදිය, හංවැල්ල.
සිතුරුවන පොත්හල (පුද්ගලික) සමාගම, නො 112, හයිලෙවල් පාර, මීපේ හංදිය, පාදුක්ක.
සිතුරුවන පොත්හල (පුද්ගලික) සමාගම, නො 20, එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, හොරණ පාර, පාදුක්ක.
සරසවි පොත්හල (පුද්ගලික ) සමාගම, 1/50, වයි.එම්.බී.ඒ. ගොඩනැගිල්ල, බොරැල්ල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 82, මොරටුව පාර, පිළියන්දල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 175, හොරණ පාර, කොට්ටාව, පන්නිපිටිය.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො. 413, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
මැක්මිලන් පොත්හල, නො 195, ඕල්කට් මාවත, කොළඹ 11.
සුසර ප්‍රකාශන (පුද්ගලික) සමාගම, 180/43, පීපල්ස් පාක්, කොළඹ 11.
සුසර ප්‍රකාශන (පුද්ගලික) සමාගම, 65, මාකොළ පාර, කිරිබත්ගොඩ
ඇම්.ඩී.ගුණසේන සහ (පුද්ගලික) සමාගම, 217, ඕල්කට් මාවත, කොළඹ 11.
ඇම්.ඩී.ගුණසේන සහ (පුද්ගලික) සමාගම, 27, ගාලු පාර, බම්බලපිටිය.
ඇම්.ඩී.ගුණසේන සහ (පුද්ගලික සමාගම), 1129, මරදාන පාර, කොළඹ 08.
ඇම්.ඩී.ගුණසේන සහ (පුද්ගලික සමාගම), 239, හිල්ස්ට්‍රීට්, දෙහිවල.
ඇම්.ඩී.ගුණසේන සහ (පුද්ගලික) සමාගම, 4, නුවර පාර, කිරිබත්ගොඩ.
ඇම්.ඩී.ගුණසේන සහ (පුද්ගලික) සමාගම, සී.එම්.එස්. බාලිකා පාසල, අර්න්ස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
ඇම්.ඩී.ගුණසේන සහ පුද්ගලික සමාගම, 133ඩී, වජිර පාර, කොළඹ 05.
ඇම්.ඩී.ගුණසේන සහ (පුද්ගලික) සමාගම), සැන් සෙබැස්ටියන් හිල්ස්, කොළඹ 12.
ඇම්.ඩී.ගුණසේන සහ (පුද්ගලික) සමාගම), 73, රත්නපුර පාර, අවිස්සාවේල්ල.

02. ගම්පහ - කේ.ඒ. ආරියදාස සහ සමාගම, 32, කෙලින් වීදිය, වෙයන්ගොඩ.
සම්පත් පාලිත ද සේරම් පොත් සමාගම, අංක 60, සම්පත් ෆිනෑන්ස් බිල්ඩිං, නුවර පාර, කිරිබත්ගොඩ.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 87, මිනුවන්ගොඩ පාර, ගම්පහ.

විජිතයාපා පොත්හල, 135, රාජපක්ෂ බ්‍රෝඩ්වේ, මීගමුව.
රෝහන පොත්හල සහ හාඩ්වෙයාර් ස්ටෝර්ස්, නව නුවර පාර, දෙල්ගොඩ.
ගංගා පොත්හල, 134, නුවර පාර, නිට්ටඹුව.
සරසවි පොත්හල, නො.36, කෙලින් වීදිය, ගම්පහ.
පර්නෝ ස්ටේෂනරිස්, නො. 92, මිගමු පාර, ජා ඇල.
මහජන පොත්හල, 141, සේරම් ගොඩනැගිල්ල, නුවර පාර, කඩවත.
දිස්නා පොත්හල, නො. 650, අත්තනගල්ල පාර, නිට්ටඹුව.
වන්මිනි පොත්හල, 20/5, පස්යාල පාර, මීරිගම.
මින්සර පොත්මැදුර, අංක 12, තානායම පාර, ගම්පහ.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො. 134 ඒ, පැරණි මීගමු පාර, වත්තල.
සරසවි පොත්හල (පුද්ගලික ) සමාගම, නො. 151/1, නුවර පාර, කිරිබත්ගොඩ.
ෆොන්සේකා පොත්හල, 77, හලාවත පාර, කොච්චිකඩේ.
නිව් ආසිරි පොත්හල, අංක18, දිවුලපිටිය පාර , මිනුවන්ගොඩ.
සමනල රීඩ්රයිට් ඉන්ටනැෂනල් (පුද්ගලික සමාගම), 19, සිරිවර්ධන මාවත, මිනුවන්ගොඩ.
සමනල රීඩ්රයිට් ඉන්ටනැෂනල් (පුද්ගලික) සමාගම, අංක 136, මීගමුව පාර, නාගොඩ, කඳාන.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, 7 බී, මංගල පාර, ගම්පහ.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, අංක 64, ද කෲස් පාර, මීගමුව.
විජිත යාපා පොත්හල, මීගමු ප්‍රකාශකයෝ, මීගමුව.

03. කළුතර -

ඕකිඩ් එන්ටප්‍රයිසස්, 109, අගුරුවාතොට පාර, හොරණ.
විජය පොත්හල, 20, අලුත්ගම පාර, මතුගම.
විජය පොත්හල, 54 ඊ, කෙලින් වීදිය, කළුතර දකුණ.
ලක් ඉසුරු පුද්ගලික සමාගම, 324, කෙලින් වීදිය, පානදුර.
නිව් ප්‍රදීපා පොත්හල, නො. 51/ සී, කළුතර පාර, බණ්ඩාරගම.
වාද්දුව පොත්හල, ගාලු පාර, වාද්දුව.
ලුමිනෙක්ස් ග්‍රොසරිස් ප්‍රයිවෙට් ලිමිටඩ්, 465, ගාලුපාර, පානදුර.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 41, අඟුරුවාතොට පාර, හොරණ.
විජය පුවත්පත්හල, රත්නපුර පාර, බුලත්සිංහල.
සවිඳු පොත්හල, නො. 20, රත්නපුර පාර, ඉංගිරිය.
රන්සික පොත්හල, 437/18, මතුගම පාර, අඹගහ හන්දිය, දර්ගා නගරය.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික සමාගම), අංක 377 ඩී, ගාලුපාර, පානදුර.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික සමාගම), අංක 92, ගාලුපාර, කළුතර දකුණ.
සරසි පොත්හල, නො. 05, ගාමිණී පාර, මතුගම.
පුවත්පත් වෙළඳසැල, නො.03, දුම්රියපොළ පාර, කළුතර දකුණ.
ගාල්ල පොත්හල සහ බෙදාහරින්නෝ, නො. 91, අඟුරුවාතොට පාර, හොරණ.

04. මහනුවර -

විජිතයාපා පොත්හල, 05, කොටුගොඩැල්ල වීදිය, මහනුවර.
දවස පොත් මැදුර, අංක 12, නුවරඑළිය වීදිය, ගම්පොල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 86, ඩී.එස්. සේනානායක වීදිය, මහනුවර.
ලංකා මධ්‍යම පොත්හල, නො.84, කොළඹ වීදිය, මහනුවර.
සමුද්‍රා පොත්හල, පේරාදෙණිය පාර, මහනුවර.
සමුද්‍රා පොත්හල, අංක 74, ඩි.එස්. සේනානායක වීදිය, මහනුවර
සීවලී පොත්හල, නො.16, යටිනුවර වීදිය, මහනුවර.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො. 21, දෙවන මහළ, කැන්ඩි සිටි සෙන්ටර්, මහනුවර.
කේ.එම්.ඒ. පොත්හල, 56, මාතලේ පාර, අකුරණ.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, අංක 33, යටිනුවර වීදිය, මහනුවර.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, අංක 104, කොළඹ වීදිය, මහනුවර.

විජිත යාපා පොත්හල, අංක 20, 2 වන මහල, කැන්ඩි සිටි සෙන්ටර්, මහනුවර.

05. නුවරඑළිය - වීජ් සයිඩ් පොත්හල, නො. 40, ගම්පොල පාර, නාවලපිටිය.
සරසවි ඉලෙක්ට්‍රිකල්ස් ඇන්ඩ් බුක්ෂොප්, අංක 06, නුවර පාර, රිකිල්ලගස්කඩ.

06. ගාල්ල - විජිතයාපා පොත්හල, නො.12 ,වක්වැල්ල පාර, ගාල්ල.
රෝයල් පොත්හල, 152,මහ වීදිය, අම්බලංගොඩ.
විතාන පොත්හල, 04, බද්දේගම පාර, වදුරඹ.
සේන පොත්හල ,ඇල්පිටිය .
ගමගේ පොත්හල, නො 20, නාගොඩ පාර, බද්දේගම.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, පළමු මහළ, මධ්‍යම බස් නැවතුම්පළ, ගාල්ල.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, අංක 02, මාතර පාර, ගාල්ල.
වෙනස පොත්හල, කන්දේගොඩවත්ත, යක්කාලමුල්ල, ගාල්ල.

07. මාතර - එච්.බී. එරමානිස් අප්පුහාමි සහ පුත්‍රයෝ, 87, ධර්මපාල මාවත, මාතර.
වීරසිංහ පොත්හල, මාතර පාර, කඹුරුපිටිය.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 4, දුම්රියපොළ පාර, මාතර.
විජිතයාපා පොත්හල, 5 ඒ - 1/1, ධර්මපාල මාවත,මාතර.
විජිත යාපා පොත්හල, අංක 10, හක්මන පාර, මාතර.
ලස්සන පොත්හල,දෙනියාය පාර, මොරවක.
සැඹුකො ඩේටා බියුරෝ සහ පොත්හල, අංක 93, වර්ල්ඩ් මාර්කට්, අකුරැස්ස.
සමුද්‍රා පොත්හල, නො. 127, එස් කේ සිනමා බිල්ඩින්, තංගල්ල පාර, කොටුවේගොඩ, මාතර.
සමුද්‍රා පොත්හල, අංක 128, එස්.කේ. සිනමා, කොටුවේගොඩ, මාතර
අබේවික්‍රම පොත්හල, වීරකොන් වත්ත, උරුබොක්ක.
රසික පොත්හළ, නො. 50 ඒ, අකුරැස්ස පාර, රාහුල හංදිය, මාතර.
සුසර ප්‍රකාශන (පුද්ගලික) සමාගම, අංක 14, ආරියරත්න ගොඩනැගිල්ල, හක්මන පාර, මාතර.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, අංක 27, අනගාරික ධර්මපාල මාවත, මාතර.

08. හම්බන්තොට - මුතුමාල පොත්හල, 117, මහ වීදිය, තංගල්ල.
එම්.ඒ.එස්. ට්‍රේඩර්ස්, 24, සුපර් මාර්කට්, වලස්මුල්ල.
නව සුමිහිරි ට්‍රේඩ් සෙන්ටර්, නො 11, මහ වීදිය, අම්බලන්තොට.
නිව් ලහිරු පොත්හල, 562, හම්බන්තොට පාර, ගහසිරිපුර, තිස්සමහාරාමය.
අබේසිංහ පොත් මැදුර, තලාව පාර, මිද්දෙණිය.
සීවලී පොත් මැදුර, විද්‍යාල මාවත, සූරියවැව නගරය.

09. යාපනය - පූබාලසිංහම් පොත්හල, 04, රෝහල පාර, යාපනය.

10. වව්නියාව - රාමචන්ද්‍රරාස්, නො. 20 ඒ, බස්නැවතුම්පොළ සංකීර්ණය, වව්නියාව.

11. මඩකලපුව - ආර්.ඩී.පොත් කේන්ද්‍රය, තගමනිපති, අංක 05, ප්‍රධාන පාර, පෙරියකල්ලාර් - 02, (30250), කල්ලාර්.

12. අම්පාර - ෆොටෝ රියෝ, 120 ඒ, කෙලින් වීදිය, කල්මුනේ.
සෙන්ට්‍රල් පොත්හල, පොතුවිල් පාර, අක්කරෙයිපත්තු.
ජ්ලස් කොම්, 84/බී/1, ජී.එම්.එම්.එස්. පාර, සායින්දමරුදු – 11.
මෙගාලයින් මෙගා පොත්හල සහ ලිපි ද්‍රව්‍ය, 53, මහවීදිය, කල්මුනේ.

13. පුත්තලම - සමන්ති පොත්හල, 39, මාරවිල පාර, නාත්තණ්ඩිය.
ද පේපර් හවුස්, 12, කොළඹ පාර, පුත්තලම.
මයුර පොත්හල, 08, කොළඹ පාර, හලාවත.
ඇක්මින් පොත්හල, නො. 3/5, පුද්ගලික බස් නැවතුම්පළ, හලාවත.
රඹසෙවන පොත්හල, වෙන්නප්පුව.

A 2 Z පොත්හල, 230, මන්නාරම පාර, පුත්තලම.
රෙඩ්සි පොත්හල, නො. 02, මහජන බැංකුව අසළ, නාත්තන්ඩිය.

14. කුරුණෑගල - සමුද්‍රා පොත්හල, 10, පුත්තලම් පාර, කුරුණෑගල.
සමුද්‍ර පොත්හල, 8/2, මිහිඳු මාවත, කුරුණෑගල.
සමුද්‍ර බුක් කාපුරියෝ, අංක 25/27, පුත්තලම පාර, කුරුණෑගල.
සමුද්‍ර පොත් නිවස, අංක 04, රජපිහිල්ල මාවත, කුරුණෑගල.
සරසවි මාර්කටින් එන්ටර්ප්‍රයිසස්, 135, කොළඹ පාර, කුරුණෑගල.
චතුරංග පොත්හල, නො. 60, කුරුණෑගල පාර, පන්නල.
මිහිර පොත්හල, 41, හලාවත පාර, වාරියපොල.
සමාධි පොත්හල, අංක 7-8, නව බස් නැවතුම්පල, ගල්ගමුව.
පවිත්‍රා පොත්හල, කෙලින් වීදිය, මහව.
සම්පත් පොත්හල, 49, කොළඹ පාර, කුරුණෑගල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො. 56, කොළඹ පාර, කුරුණෑගල.
හන්සිත පොත්හල, 43/1, කුරුණෑගල පාර, වාරියපොළ.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, අංක 67, කොළඹ පාර, කුරුණෑගල.
කුමුදිත පොත්හල, 101/ C, පුත්තලම් පාර, නිකවැරටිය.

15. අනුරාධපුරය - ගුණසේකර සහ සමාගම, 234, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුරය.
බුද්ධික පොත්හල, 282, මහ වීදිය, බැංකු පෙදෙස, අනුරාධපුරය.
මුතුකුඩ පේපර් කෝනර් සහ ප්‍රින්ටර්ස්, නව නගරය, තඹුත්තේගම.
ෆැන්ටා හවුස්, තලාව පාර, එප්පාවල.

16. පොළොන්නරුව - දීපානි පොත්හල, 70, පොදු වෙළඳපල, හිඟුරක්ගොඩ.
නිව් දීපානි පොත්හල, අංක 125, ඩී.එස්.සේනානායක විදිය, හිගුරක්ගොඩ
පුවාසා පොත් මැදුර, රෝහල හන්දිය, පොළොන්නරුව.
ප්‍රියංකර පොත්හල, 09, මහ වීදිය, කඳුරුවෙල.

17. බදුල්ල - ඉසුරු ෆෙයාර්, 80, නුවරඑළිය පාර, වැලිමඩ.
මහින්දාස් පොත්හල, නො. 50, 52, බසාර් විදය, බදුල්ල.
වික්රික් මල්ටි වෙළඳසැල (පුද්ගලික) සමාගම, නො. 04, බෞද්ධ මන්දිර පාර, වැලිමඩ.
චැනල් නෙට් පොත්හල, නො. 06, බදුල්ල පාර, මහියංගනය.

18. මොණරාගල - මයිසන් ට්‍රේඩ් සෙන්ටර්, නො. 26, කෙලින් වීදිය, මොණරාගල.
ඒ.ඩී.එස්. ඒජන්සීස්, නො. 14, මහ විදිය, බිබිල.
සුමධුර පොත්හල, අංක 22, පොතුවිල් පාර, මොණරාගල.
සුහද පොත්හල, තිස්ස පාර, වැල්ලවාය.

19. කෑගල්ල - ශ්‍රී ලංකා පොත්හල, 89, උසාවිය හන්දිය, කෑගල්ල.
ධර්මවර්ධන පොත්හල, බස් නැවතුම, නො. 01, පහත මාලය, අඟුරුවැල්ල, රුවන්වැල්ල.
ලංකා පොත්හල, 122, කෙළින් වීදිය, වරකාපොල.
A.J. කොමියුනිකේෂන් සහ පොත්හල, 21 A, උසාවිය පාර, මාවනැල්ල.
ජයන්ති පොත්හල, 132, කෙලින් වීදිය, මාවනැල්ල.
කලයාණී පොත්හල, නො. 44, මහවීදිය, රුවන්වැල්ල.
ලංකා පොත්හල, 50/10B, අඟුරුවැල්ල පාර, වරකාපොල.
සමගි පොත්හල, ප්‍රධාන නගර මධ්‍යය, ගලිගමුව.

20. රත්නපුර - කරුණාරත්න සහෝදරයෝ, 16, පල්ලිය පාර, රත්නපුර.
ජිනසිරි ට්‍රේඩ් සෙන්ටර්, 96, කෙලින් වීදිය, බලන්ගොඩ.
කුරුළු පොත්හල හා කොමියුනිකේෂන්, 79/ ජී, කෙලින් වීදිය, පැල්මඩුල්ල.
සරසවි පොත්හල (පුද්ගලික සමගම), නො. 23/1, සෙනවිරත්න ගොඩනැගිල්ල, පළමු මහළ, කොළඹ පාර, රත්නපුර.
සුබසේකර ස්ටෝර්ස්, 168 ඒ, කෙළින් වීදිය, කහවත්ත.
සිහින පොත්හල, බස් නැවතුම්පළ පාර, කුරුවිට.

21. කිලිනොච්චි - අරිවුනනි පොත්හල, අංක 06, කනකපුරම් පාර, කිලිනොච්චි.

අංක 20 , වෝඩ් පෙදෙස,
කොළඹ 07.
2021.05.21